**ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - 2015**

-----------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 29 වගන්තියේ 2 උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව වාර්තා කරන දිනයෙන් පසු මාස 12 ක් ඇතුළතදී නිරවුල් කිරීමට නියමිත ශේෂයන් ජංගම වගකීම් ලෙස දැක්විය යුතු වුවත් මාස 12ක් ඇතුළත සේවයෙන් විශ්‍රාම ගන්නා නිලධාරීන් 05 දෙනෙකු සඳහා ගෙවිය යුතු රු.3,027,915 ක පාරිතෝෂික දීමනා සඳහා වෙන් කිරීම් ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

සී.එන්.සී මිලින් යන්ත්‍රය ප්‍රයෝජනවත් තත්ත්වයට පත් කිරීම සඳහා ඉකුත් වර්ෂවලදී හා සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.6,234,580 ක වියදම අයහාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී යන්ත්‍රය රු.10,000,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි. ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනා නොගැනීම නිසා ප්‍රත්‍යාගණන අතිරික්තය රු.6,234,580 ක් වැඩියෙන් දක්වා තිබූ අතර ඉකුත් වර්ෂවල ලාභයට වූ බලපෑම අතීතානුයෝගීව ගලපා නොතිබුණි.

**2.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට වෙළඳ ණයගැති ගිණුම් 15 ක එකතුව රු.8,506,214 ක ශේෂයෙන් වර්ෂ 05ට වැඩි කාලයක සිට පැවත එන ණයගැති ශේෂය රු.637,056 ක් විය.

(ආ) 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වාවූ කාලපරිච්ඡේදය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු එකතු කළ අගය මත බදු මුදල් රු.29,063,703 ක් හා රඳවා ගැනීමේ බදු මුදල් රු.239,092 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,923,687 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.17,016,180 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.10,092,493 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් හා අනෙකුත් වියදම් රු.42,429,568 කින් වැඩිවීම හා ක්‍රමක්ෂය ගැලපීම රු.14,576,568 කින් අඩුවී තිබුණද පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.35,327,235 කින්, අනෙකුත් ආදායම් රු.5,522,359 කින්

වැඩිවීම සහ ක්ෂය රු.26,208,349 කින් අඩුවීම ඌනතාවය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2011 වර්ෂයේදී රු.26,169,768 ක් වූ ඌනතාවය 2013 වර්ෂය වනවිට තවදුරටත් රු.28,114,860 ක් දක්වා වර්ධනය වුවද 2015 වර්ෂය වන විට එය රු.6,923,687 ක් දක්වා අඩු වී තිබුණි. එසේ වුවද සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයේ දී රු.167,403,814ක් වූ දායකත්වය 2015 වර්ෂය වනවිට රු.238,575,440 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1974 අගෝස්තු 14 දිනැති අංක 124/6 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන පරමාර්ථ වනුයේ,

- තාක්ෂණික විද්‍යාවේ සංවර්ධනය සඳහා අවශ්‍ය ආයතනික ක්‍රම ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ කර්මාන්තයන්හි සහ ආයතනයන්හි තාක්ෂණික ශිල්පීය, ඉංජිනේරු හා පර්යේෂණ කුසලතාවයන් ඒකාබද්ධ කිරීම පිණිස පහසුකම් සැලැස්වීම, පර්යේෂණ කටයුතු භාර ගැනීම, පුහුණු කිරීමේ කටයුතු වැඩිදියුණු කිරීම සහ අඛණ්ඩ උපදේශක සේවාවන් සැලසීම.

- රටේ සම්පත් දායාදයන්ට සහ ජාතික ක්‍රම සම්පාදනයේ අරමුණුවලට අනුකූලවන තාක්ෂණික ශිල්පීය ක්‍රම උපයුක්ත කිරීමට සහ ඒවා යොදා ගැනීමට වගබලා ගැනීම.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි උචිත ආයතනයන්ට ඍජු ආකාරයෙන් සහ වක්‍ර ආකාරයෙන් තාක්ෂණික ශිල්පීය ක්‍රම මාරු කිරීමේ උපක්‍රමය පරීක්ෂා කිරීම සහ උචිත තාක්ෂණ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීමෙන් ශ්‍රම සහ අමුද්‍රව්‍ය සම්පත් වලින් උපරිම උපයෝජන ලබාගැනීම සඳහා ආයතනයන්ට උපදෙස් හා අනුබල ලබාදීම.

- කාර්මික, වාණිජ සහ වෙනත් අරමුණු සඳහා ආදර්ශ යන්ත්‍ර සහ නියමු යන්ත්‍රාගාර අරපිරිමැස්මෙන් යුක්තව සැලසුම් කිරීම, නිෂ්පාදනය කිරීම සහ පරීක්ෂා කර බැලීම.

- ඉංජිනේරු ශිල්පීය සැලසුම් සහ පර්යේෂණ පිළිබඳව තාක්ෂණික දත්තයන් සහ ලේඛනායනය අඛණ්ඩව සමීක්ෂණය කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා හඳුන්වා දුන් නව තාක්ෂණ හා තාක්ෂණ උපකරණ 24 න් 16 ක ප්‍රතිඵල මහජනතාව වෙත ලැබෙන පරිදි තාක්ෂණ පැවරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සැලසුම් නිර්මාණ හා කර්මාන්ත සඳහා උපදේශක අංශය විවිධ ඩයි සහ අච්චු නිර්මාණය කිරීමේ හා සේවා සැපැයීමේ ඇණවුම් 120ක් සම්පූර්ණ කිරීමෙන් රු.6,500,000 ක ආදායමක් ඉපයීමට සැලැසුම් කර තිබුණද ඇණවුම් 50ක් සම්පූර්ණ කිරීමෙන් රු.1,686,000 ක් පමණක් උපයා තිබුණි. "CNC Milling" යන්ත්‍රය අක්‍රිය වීම හේතුවෙන් ඉලක්ක කරා ළඟා වීමට නොහැකි වූ බව මධ්‍යස්ථානය විසින් දන්වා තිබුණද 2013, 2014 හා

සමාලෝචිත වර්ෂයේදී එම යන්ත්‍රය රු.6,234,580 ක් වැයකර ක්‍රියාකාරී තත්ත්වයට පත්කර තිබියදීත් අපේක්ෂිත ඉලක්ක ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) "Flap gates" ව්‍යාපෘතියෙන් රු.4,500,000 ක් ඉපයීමට ඉලක්ක කළද සමාලෝචිත වර්ෂයේදී රු.192,000 ක් පමණක් උපයා තිබූ අතර ඉලක්ක කරා ළඟාවී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කළ ව්‍යාපෘති 02 ක් සඳහා දෙසැම්බර් 31 දිනට සියයට 100ක ප්‍රගතියක් අපේක්ෂා කළද ළඟා කරගත් ප්‍රගතිය පිළිවෙලින් සියයට 70 ක් සහ සියයට 52 ක් විය.

(ඉ) ඉකුත් වර්ෂයේ ආරම්භ කරන ලද Development of Biomass Fuelled Temperature controllable Bakery Oven ව්‍යාපෘතියෙහි සමාලෝචිත වර්ෂයේදී සියයට 11ක ප්‍රගතියක් බලාපොරොත්තු වුවද ව්‍යාපෘතියේ කිසිදු කටයුත්තක් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකර නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂවලදී ආරම්භ කළ ව්‍යාපෘති 08 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.5,938,000 ක ප්‍රතිපාදන වලින් සම්පූර්ණයෙන් නිම කිරීමට සැලසුම් කළද සමාලෝචිත වර්ෂය අවසාන වන දිනට නිම කිරීමේ ප්‍රගතිය සියයට 03 සිට සියයට 55 ක් දක්වා පරාසයක පැවතුණි.

(උ) Design and Fabrication a Hyperbaric Oxygen Chamber for Hyperbaric Oxygen Therapy ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ රු.2,100,000 ක ප්‍රතිපාදන වෙන්කර භෞතික ප්‍රගතිය සියයට 85 ක් ළඟා කර ගැනීමට අපේක්ෂා කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් ළඟා කරගෙන තිබුණේ සියයට 32 ක් පමණි.

(ඌ) පර්යේෂණ ව්‍යාපෘති 02 ක් සඳහා 2014 වර්ෂය දක්වා එකතුව රු.630,667ක් වැය කළද අදාළ කාල සීමාවේදී පර්යේෂණය අවසන් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂය වන විට එම ව්‍යාපෘති 02 අක්‍රීය තත්ත්වයට පත්වී තිබුණි.

**4.2 කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ජීවවායු ඒකකය තැනීම - කුරුණෑගල ශික්ෂණ රෝහල**

-----------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) කුරුණෑගල ශික්ෂණ රෝහලේ ජීව වායු ඒකකයක් තැනීමේ ව්‍යාපෘතිය රු.3,076,525(බදු රහිත) ක වටිනාකමකට 2014 නොවැම්බර් මාසයේදී ආරම්භ කර 2015 ජුලි මාසයේදී අවසන් කිරීමට අපේක්ෂා කළද ව්‍යාපෘතිය 2016 ජුනි මාසයේදී නිමකර තිබුණි.

(ii) ජීව වායු ජීරක සෑදීමට යෝජනා කළ ස්ථාන වෙනස්වීම හේතුවෙන් අමතර යන්ත්‍ර හා ශ්‍රමය යොදා ගැනීමට සිදුවී තිබුණු අතර ඒ සඳහා අමතරව වැය වූ රු.175,800 ක් ඇතුළුව ව්‍යාපෘතියෙහි මුළු වියදම රු. 4,826,832 ක් වූයෙන් ව්‍යාපෘතියෙන් රු.1,750,307 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී වැඩ අවසන් ව්‍යාපෘතියක් ලෙස දක්වා තිබූ පොළොන්නරුව රෝහල් හෙද නේවාසිකාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියෙහි ඒකක මිල ගණන් සම්බන්ධව එකඟතාවයකට පැමිණ නොතිබීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට ණයගැතියන් ලෙස දක්වා තිබූ රු.7,185,063 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකර ගැනීමට නොහැකි වී තිබුණි. තවදුරටත් අඩුපාඩු සකස් කිරීම සඳහා 2014 වසරේදී හා සමාලෝචිත වර්ෂයේදී වැයකළ

එකතුව රු.810,254 ක් අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් මධ්‍යස්ථානයට පාඩු වී තිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධායක මට්ටමේ තනතුරුවල 26 ක්ම සමාලෝචිත වර්ෂය පුරාම පුරප්පාඩුව පැවති අතර "නිලධාරීන් රඳවා ගැනීමට ඇති අපහසුව මෙම පුරප්පාඩු සඳහා ප්‍රධානම හේතුව බව" සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

(ආ) අනුමත සමස්ත කාර්යමණ්ඩලයේ තනතුරුවල 357 න් පුරප්පාඩු 89 ක් පැවතීම මධ්‍යස්ථානය සැලසුම්කළ ව්‍යාපෘති ප්‍රමාදවීමට බලපා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලනයන්**

--------------------------

විගණනයේ දී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මධ්‍යස්ථානයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. වාණිජ ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුමකට එළඹීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අංශ හා මූල්‍ය අංශය අතර පැහැදිලි එකඟතාවයකින් යුතුව ව්‍යාපෘති සම්බන්ධයෙන් තීරණ ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.